# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAANS

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XIV — YEAR OF OUR LORD JESUS CHRIST, SEPTEMBER 2020 — Issue No. 11


## ශුද්ධවූ බයිබලය
### (ගීතාවලිය 4:1-8)

1. මාගේ ධර්මිෂ්ඨකමේ දෙවියන්වහන්ස මා හඬගසන කල මට උත්තර දෙනු මැනව. විපත්තියේදී ඔබ මා මිදූ සේක. මට කරුණාකොට මාගේ යාච්ඤාව අසනු මැනව.
2. මනුෂ්‍යය පුත්‍රයනි, මාගේ ගෞරවය කොපමණ කල අගෞරවයට පෙරන්නහුද? තෙපි කොපමණ කල් නිෂ්ඵල දේට ඇලුම්ව බොරුව සොයන්නහුද?
3. නමුත් ස්වාමීන්වහන්සේ භක්තිවන්තයා තමන්ටම වෙන්කරගත් බව දැනගනිව්. ස්වාමීන්වහන්සේට මා හඬගසන කල උන්වහන්සේ අසන සේක.
4. භයින් සිටිව්, පව් නොකරව්. යහනේදී නුඹලාගේ සිතින් විමසා නිශ්චලවව්.
5. ධර්මිෂ්ඨකමේ පූජා පුදමින්, ස්වාමීන් කෙරෙහි විශ්වාසය තබව්.
6. අපට යහපතක් දක්වන්නේ කවරෙක්දැයි බොහෝ දෙන කියති. ස්වාමිනී, ඔබගේ මුහුණේ එළිය අප කෙරෙහි බැබළෙවුව මැනව.
7. ඔවුන්ගේ ධාන්‍ය හා මුද්‍රික පානය වැඩිවූ කල්හි ඔවුන්ට ඇති ප්‍රීතියට වඩා ඔබ මාගේ සිතේ ප්‍රීතියක් ලූසේක.
8. මම සමාදානයෙන් වැතිරී නිදන්නෙමි. මක්නිසාද ස්වාමිනී, ඔබ මා හුදක්ම සුවසේ වාසය කරවන සේක.

## තෝරා ගැනීම සහ අභියෝගය

*(සහෝදර එච් ඉම්බරාජ්)*

***''ඔසවාගනු ලැබූ දවස දක්වා උන්වහන්සේ විසින් කරන්ටත් උගන්වන්ටත් පටන්ගත් සියල්ල ගැන ප්‍රථම පොත සම්පාදනය කළෙමි.'' (ක්‍රියා 1:2)***

18 වන සියවසේදී ප්‍රංශය හා එංගලන්තය අතර මහත් යුද්ධයක් පැවතුනි. ප්‍රංශයේ හමුදාව ඔවුන්ගේ නායකයා වන නැපෝලියන් බොනපාට්ගේ නායකත්වයෙන් යුද්ධ කලේය. එංගලන්ත හමුදාව නෙල්සන් නැමැති හමුදාපති විසින් මෙහෙයවුවේය. ප්‍රංශයේ හමුදාපති වූ නැපෝලියන් බොනපාට්ව කෙසේ හෝ පරදවන පිණිස යුද්ධ කරන්නය කියා එංගලන්තය නායකයා වූ නෙල්සන් පැවසීය. මෙම යුද්ධයේදී එංගලන්තයේ නෙල්සන් තුමාට එක් කකුලක් හා එක් ඇසක් අහිමි විය. එහෙත් ඔහු දිගටම යුද්ධ කලේය. නැපෝලියන් පවා ඔහුට ප්‍රසාදය දැක්වූවේය. නෙල්සන්ට ලැබුණු අණ පරිදි ඔහුගේ කැපවීමේ ක්‍රියාව දැක නැපෝලියන් ඉතා මවිතයට පත්විය.

නෙල්සන් ලෝකයේ තිබූ බලතල වලට කැප විය. එසේනම් රජවරුන්ගේ රජ, ස්වාමින්ගේ ස්වාමි වු දෙවියන්වහන්සේට අප කොතරම් කැපවී ක්‍රියාකල යුතු ද? තමාගේ නායකත්වයට යටත් වී කැපවී ක්‍රියා කළ නිසා නෙල්සන් ඉතිහාසගත විය. එනම්, අපි ස්වාමීන්වහන්සේ කීකරු වූයේ නම්, උන්වහන්සේ ඔබවත්, මාවත් ගරු කරමින් ඉතිහාසයේ අපටත් ගෞරවනීය නාමයක් දෙනු ඇත. විශ්වාසවන්ත දාසයා ගැන දේව වචනය මෙසේ පවසයි. ***''ඔහුගේ ස්වාමියා ඔහුට කතාකොට, යහපත් වූ දාසය, ඒ යහපත ස්වල්ප දේ ගැන නුඹ විශ්වාසවූවෙහිය. බොහෝ දේ කෙරෙහි නුඹ අධිපති කරමි. නුඹේ ස්වාමියාගේ ප්‍රීතියට ඇතුල්වෙන්න'' (මතෙව් 25:21)***

3 වෙනි පිටුවට ...

*Touching lives by Teaching ....... Since 1969*

# කැඳවීමේ ප්‍රතිරාවය

"එම්බා යාකොබ්, නුඹ මැවුවාවූ එම්බා ඉශ්‍රායෙල්, නුඹව සෑදුවාවූද ස්වාමින්වහන්සේ මෙසේ කියනසේක, භය නොවෙන්න, මක්නිසාද මම නුඹ මුදාගතිමි, නුඹේ නම කියා හඬ ගැසීමි, නුඹ මාගේය." (යෙසායා 43:1)






**ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රේමණීය මිත්‍රයිනි,
අපගේ ස්වාමී වූ ගැළවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මිහිරිමත් වූ නාමයෙන් ඔබට සුභ පතමි.**

පුරා වසර 50ක් මුළුල්ලේම මේ සේවයට දෙවියන්වහන්සේ කල ආශිර්වාදයන් සිහිවන විටදී අපගේ හදවත් මහත් සතුටකින් පිරි ඉතිරී යයි. කැඳවීමේ ප්‍රතිරාවය සේවයෙහි යෙදෙන්නාවූ සියලු දෙනාම වසර 50 ක් කාලය තුලදීම යාච්ඤාවෙන් හා මුදල්මය අතින් අපට උපකාර කලාවූ සියලු දෙනාටම අපගේ ස්තුතිය අප පුද කරමු. අගෝස්තු මස 9 සිට 11 වන දින දක්වා අපගේ ප්‍රධාන සභාවේ අප ඉතා යටහත් පහත් ආකාරයට 50 වෙනි සැමරුම සැමරුවේය. මේ උදෙසා යාච්ඤා කලාවු, උපකාර කලාවු සුභ පණිවිඩ එවු හා අපව ධෛර්‍යමත් කලාවු සැම මිතුරු මිතුරියන්ටම අපි ස්තුති කරම.

අපගේ ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසල ගැන යමක් ඔබට පැවසීමට කැමැත්තෙමි. මේ පාසල තුල දුප්පත් ළමුන් 500 කට වඩා අප පාසලේ ඉගෙනුම ලබති. අපගේ මෙම පාසලේ රජයේ විභාගයට පෙනි සිටි සිළුම දරුවන් ඉතා ඉහළ මට්ටමින් සමත් වී ඇත. මීට වසර 22 කට පෙර මෙම පාසල ආරම්භ කර ඇති බැවින් එම ගොඩනැගිල්ලේ සමහර බිත්ති නැවත සෑදීමටත්, එහි තීන්ත ආලේප කිරීමටත්, ටයිල් ඇල්ලීමටත්, අවශ්‍යව වී තිබේ. මන්ද මෙම පාසලේ ඉදිරි කාලයේදී ඉතා ඉහළ මට්ටමින් පවත්වාගෙන යාමට අදහස් කෙරේ. මේ සඳහා අපට විශාල මුදලක් අවශ්‍ය ඇති බැවින් ඔබගේ යාච්ඤාව හා උපකාරය අප බලාපොරොත්තු වෙමු. නෙහෙමියා බයිබල් විදුහලට දෙවියන්වහන්සේ මේ වසරේ ශිෂ්‍යයින් 50 දෙනෙක් පමණ දී අපගේ විදුහල ශක්තිමත් කර තිබේ.

අගෝස්තු මස 17 සිට 24 වන දින දක්වා 'මනුෂ්‍ය ජීවිතයට දෙවියන්වහන්සේගේ කැඳවීම' නමින් සම්මේලනයක් පැවැත්විය. අපගේ බයිබල් විදුහලේ ශිෂ්‍යයින් සහ අනෙකුත් සභාවල නායකයින් මෙයට සහභාගි විය.

අගෝස්තු මස 3 හා 4 වන යන දිනයන්හිදී අපගේ ප්‍රධාන සභාවේදී විශේෂ රැස්වීම් පැවැත්වු අතර දෙවියන්වහන්සේ එයට මහත් ලෙස ආශිර්වාද කලේය.

අපගේ සුභාරංචි පත්‍රිකාවන් මුද්‍රණය මසකට දස දහසකට වඩා මුද්‍රණය කරනු ලබයි. තවද දහස් ගණන් පත්‍රිකාද විවිධ භාෂා වලින් සඟරාද, මුද්‍රණය කරනු ලබයි. මේ සියල්ල අපගේ සේවය තුලින් නොමිලයේ කරනු ලබති.

මේ ලිපිය කියවු ඔබට ස්තුති කරමු. මේ සේවයට ඔබට හැකි ආකාරයට උපකාර කරමින් අප හා අත්වැල් බැඳ ගන්න යැයි ඇරයුම් කරමු.

ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබගේ සේවක,
එස්. සැම් සෙල්ව රාජ්

**CHIEF EDITORS**
Pastor S. Sam Selva Raj
Angeline Selvakumari Henry, M.A., M.Ed.
**MANAGING EDITOR**
Pastor Alex Samson Sam, B.Th., M.Div.
**ADMINISTRATION**
Bro. N. Prakasam, M.A., General Manager
**EDITORIAL BOARD**
Sis. Jesy Veena Sam
Bro. M. Paulraj, M.A., B.Ed.
Sis. Serena Bevin, M.A., M. Phil., B.Ed.
**ADVISORY BOARD**
Adv. Jose Abraham
Adv. N. Balaji, B.Com., B.L.
Dr. S. Rabinder Boaz, M.S.
Er. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM)
Aud. K. Puratchivendan, M.Com., B.L.
Bro. Rajeswaran Samuel, B.Com.
**PUBLISHER & PRINTER**
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+91-44) 2852 8282
2852 9293, 2854 7766
Email : sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
Websites :
www.echoofhiscall.org
www.echoofhiscall.com

**Our Ministries:** ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners Village English High School Crusades 24 Hour Prayer Ministry Community Development

*1 පිටුවෙන්....*

මාස කීපයකට පෙරදී අප පාස්කු ඉරුදින සැමරුවෙමු. දැන් ස්වාමීන්වහන්සේ තම ගෝලයින්ට දුන් අණ ගැන සිහිකිරීම වැදගත්ය. මේ අණ ගෝලයින්ට පමණක් නොව සියලුම කිතුණු දරුවන්ටය. ලෝකයේ සිටින කෝටි ගණන් දරුවන්ට මේ අණ දී තිබේ. අප සියලුදෙනාම උන්වහන්සේගේ අණට කීකරු වූ විට ලෝකයේ සිටින අනෙක් ජනගහණය දෙවියන්වහන්සේට දිනා ගැනීමට පුළුවනි. යේසුස්වහන්සේ අපට දුන් මහත් ආඥාව නම්, ''.... **එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයින් කරපල්ලා. පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගෙන් නාමයට ඔවුන් බෞතීස්මය කරපල්ලා'' (මතෙව් 28:19)**

## (A) ආඥාව යනු කුමක් ද?

අපට ඉහළින් සිටින කෙනෙක් අපට යමක් කිරීමට කියා පැවසුවහොත් එය ආඥාවක් බව අපි සියලුදෙනාම දනිමු. විශේෂයෙන් මේ 'ආඥා' ව යන වචනය පාවිච්චි කරනු ලබන්නේ හමුදා භාෂාවෙනි. එහෙත් අප දන්නවා කෙනෙක් අපට යමක් අණ කළ විට එය අප කළ යුතුමය. එය අපට අතපසු කළ නොහැක. අලුත් ගිවිසුමේ යේසුස්වහන්සේ උන්වහන්සේගේ ගෝලයින්ට දුන් ආඥාවට ග්‍රීක් භාෂාවෙන් තේරුම නම්, යාමට මඟපෙන්වීමය. එමනිසා සෑම දේව දරුවෙක්ම සත්‍යතාවය දැනගත යුතුය. එමෙන්ම යේසුස්වහන්සේ ඔවුන්ට ආඥාවන් දී තිබේය කියා එයින් ප්‍රීතිමත් විය යුතුය. උන්වහන්සේ ඒ ආඥාව ගැන පැහැදිලි මඟපෙන්වීමක් දී තිබේ''

## (B) ආඥාවේ ලක්ෂණ

i) රාජකාරිය අතපසු නොකිරීම

ඉහල නිලතල වල සිටින කෙනෙක් අපට යමක් උදෙසා අණකළ විටදී අපට කළ යුතුය කියා යම් කාර්‍යයක් පවරනු ඇත. එනම් එම කාර්‍යය ඉටු නොකර අපට ඉදිරියට යාමට නොහැකිය. අපට පැවරූ යම් රාජකාරියක් ඇත්නම් අප අනිවාර්‍යයෙන් එය ඉටුකළ යුතුය.

ii) කාලය දිය යුතුය

අපට දී තිබෙන අණට යම්කිසි කාල සීමාවක් ඇත. ඒ නියමිත කාලය තුළ දී අපට එය ඉටුකර නිමා නොකළහොත් එහි වටිනාකම නැති වී යයි. උදාහරණයක් ලෙස යම් හමුදා නිලධාරියෙකුට යම්කිසි වැඩක් බාරදුන් විට එය වෙලාවටම ඉටු නොකළහොත් සතුරාට පහර දීමට පහසු වෙයි. එනම් අපට දුන් කාලය තුළ මෙය යාච්ඤාවෙන් නිමා කිරීම ඉතා වැදගත්ය.

iii) ආඥාවට ඉලක්කයක් තිබේ

අපගේ වැඩ වලට යම්කිසි වේලාවක් දී එය ඉෂ්ඨ කිරීම අප යා යුතු ඉලක්කයක්ව තිබේ. යේසුස්වහන්සේ අපට දී ඇති ඉලක්කය නම් යාච්ඤාව තුළින් අපට දී තිබෙන ඉලක්කය සියලු දෙනාටම සුභාරංචිය ප්‍රකාශ කොට ඔවුන්ට බෞතීස්මය දී ඔවුන්ව ගෝලයන් කරනු ලැබීමයි.

## (C) ආඥාවේ අවකාශය

සාමාන්‍යයෙන් ආඥාවක් දෙන විට දී එම නිලධාරීන් සොල්දාදුවන් කණ්ඩායමකට යම් කිසි සීමාවක දී ඒ කාලය තුළ ක්‍රියාකළ යුතුය කියා පවසයි. එහෙත් අපගේ ස්වාමීන්වහන්සේ අපට දුන් ආඥාවේ බලය නම්, සීමාවක් නොමැතිව මුළු ලෝතලයටමය. එපමණක් නොව සියලු නපුරට ඉහළින් බලය ඉහල මට්ටමේ තිබේ. අඳුරු අන්ධකාර බල වලට විරුද්ධ බලය දී ස්වාමීන්වහන්සේ පවසනු ලැබුවෙමි, යේසුස්වහන්සේ පවසනු ලැබූයේ ''නුඹලා ගොස් මුළු ලෝ තලයටම එනම්, මේ අඥාවට සීමාවක්, භාෂාවක්, සංස්කෘතියක්, ජාතිභේද, ආගම්, කුල භේද ආදී කිසිවක් අඩංගු නොවී මේ හැම දෙනාටම පොදුවේ දුන් ආඥාව සියලු කිතුණුවන් සෑම ජන කොටසක්ම දිනා ගැනීම පිණිස මේ ආඥාවට කීකරු විය යුතුය. එමනිසා අප සියලුදෙනාම සුභාරංචි සේවයේ නිරතවී අපගේ යුතුකම අප ඉෂ්ඨකළ යුතුමය.

## පරණ ගිවිසුමේ ආඥාවන්

දෙවියන්වහන්සේගේ දාසයා වූ මෝසෙස් විසින් උන්වහන්සේගේ සෙනඟ වන ඉශ්‍රායෙල්ට පරණ

*4 වෙනි පිටුවට....*

ගිවිසුමේ අණ උන්වහන්සේ දුන්නේය. මෙයට අප දසපනතය කියා පවසමු. එමනිසාම නික්මයාම පොතේ 20 වන පරිච්ඡේදයේ 3 - 17 දක්නා පදවල මේ දේ සඳහන් වී තිබේ. ***''මා ඇර අන් දෙවිවරුන් සාදා නොගනිව්, රිදියෙන් දෙවිවරුන්වත්, රනින් දෙවිවරුන්වත් සාදානොගනිව්. පස්වලින් පූජාසනයක් මට සාදා නුඹේ දවන පූජා ද නුඹේ ශාන්ති පූජා ද නුඹේ බැටළුවන් ද නුඹේ ගවයින්ද එහි පූජාකරව. මා විසින් මාගේ නාමය සඳහන් කරන සියලු තැන්වලදී නුඹ වෙතට අවුත් නුඹට ආශිර්වාද කරන්නෙමි'' (නික්මයාම 20 : 23 - 24)***

පරණ ගිවිසුමෙහි දෙවියන්වහන්සේගේ අරමුණ වූයේ, මුළු ලෝ තලයම මැවූ දෙවියන්වහන්සේට මනුෂ්‍යයා මුල් තැන දෙමින් උන්වහන්සේගේ අණට කීකරු වීමයි. මන්ද මනුෂ්‍යාගේ ජීවිතය පාපයට වහල් නොවී දෙවියන්වහන්සේ සමග හරි සම්බන්ධතාවයක් පැවැත්වීමටත් උන්වහන්සේගේ අණට කීකරු වී දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ඔවුන්ගේ ජීවිත වලට අත්පත් කරගැනීමට මෙම අණ දෙනු ලැබිය. පාවුල්තුමා මෙසේ පවසයි. ***''කුමක් හෙයින්ද ව්‍යවස්ථාව ක්‍රියාවලින් කිසිම මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේ ඉදිරියෙහි ධර්මිෂ්ඨ කරනු නොලබන්නේය. මක්නිසාද ව්‍යවස්ථාව කරණකොට ගෙන පාපය දැනගැනීම වේ.''(රෝම 3:20)***

### අලුත් ගිවිසුමේ අණ

පරණ ගිවිසුම ආඥාවට වඩා හාත්පසින්ම අලුත් ගිවිසුම ආඥාවන් වෙනස්ය. නමුත් ඒ දෙකෙහිම තිබෙන තේරුම එකය. යේසුස්වහන්සේ පවසනු ලැබුයේ ''මම ව්‍යවස්ථාව විනාශ කිරීමට නොව එය සම්පූර්ණ කිරීමට මා ආවේය.''කියාය. එනම්, මේ වන තුරුම ව්‍යවස්ථාව සම්පූර්න වී නොතිබුණි. යේසුස්වහන්සේ ව්‍යවස්ථාව වෙනුවට උන්වහන්සේගේ කරුණාව ලබා දුන්නේය. අලුත් ගිවිසුමේ උන්වහන්සේගේ කරුණා කාලය ජීවිතයේ ඉහළ මට්ටමේ ශුද්ධකමේ තත්ත්වයක් බලාපොරොත්තු වේ.

පරණ ගිවිසුමේ මේ දේ ඉතා භයෙන් යුතුව කල මුත් අලුත් ගිවිසුමේ දෙවියන්වහන්සේට තිබෙන ප්‍රේමය නිසා මේ දෙය සිදුවිය යුතුය. අද මනුෂ්‍යයින්ට ප්‍රශ්න කරදර හා සෝදිසි ඇතිවන විට ඔවුන්ගේ ආත්ම ශක්තිය නැතිවී ඉක්මනටම දෙවියන්වහන්සේගේ පොරොන්දු අමතක කරති.' ***'මක්නිසාද අපට සිටින්නේ අපේ දුර්වලකම් වලදී අපේ දුක නොදැනෙන උත්තම පූජකයෙක් නොව, පව් කිරීමක් නැතුව, සියලු ආකාරයෙන්ම අප වාගේ පරීක්ෂාකරනු ලැබූ උත්තම පූජකයෙක්ය'' (හෙබ්‍රෙව් 4 : 15)*** විපත්ති කාලය ගැන දාවිත් රජතුමා මෙසේ පවසයි. ***''ස්වාමීන්වහන්සේ මාගේ ආලෝකයත්, ගැළවීමත්ය. මම කාට භයවන්නෙම්ද? ස්වාමීන්වහන්සේ මාගේ ජීවිතයේ ශක්තියය, මම කාට භීතවන්නෙම්ද?'' (ගීතාවලිය 27 : 1)***

අද බොහෝ අපට තිබෙන ප්‍රේමය හීන වී ඇති නිසා දෙවියන්වහන්සේ ඔවුන්ට දුන් පොරොන්දුද අමතක කරති. අපගේ ජීවිතයේ දෙවියන්වහන්සේගේ පොරොන්දු අප නිතරම සිහි කරමින් ඒ තුළ ක්‍රියා කිරීමට අවශ්‍ය නම්, අප දෙවියන්වහන්සේට නිරන්තරයෙන්ම ප්‍රේම කළ යුතුය.

යේසුස්වහන්සේ මේ අණ ගැන ප්‍රශ්නයක් නැගූ විට දුන් පිළිතුර නම්, ''ප්‍රධාන එක නම් අහෝ ඉශ්‍රායෙල්, අසාපන්න, අපේ දෙවියන්වහන්සේ ස්වාමීන්වහන්සේය. උන්වහන්සේ එකම දෙවියන්වහන්සේය. නුඹේ මුළු හෘදයෙන් ද නුඹේ මුළු ආත්මයෙන් ද නුඹේ මුළු බුද්ධියෙන් ද නුඹේ මුළු ශක්තියෙන් ද නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේට ප්‍රේමකරපන්න'' ***(මාර්ක් 12 : 29 - 30)*** යේසුස්වහන්සේ මෙහිදී ඔබගේ මුළු හදවතින්ම ඔබගේ ස්වාමීන්වහන්සේට ප්‍රේමකළ යුතුය. එනම්, ඒ ප්‍රේමය කළ යුත්තේ, මුළු හෘදයෙන්ද, මුළු ආත්මයෙන්ද, මුළු බුද්ධියෙන්ද, මුළු වීර්‍යයෙන්ද ප්‍රේම කළ යුතුය. තවද අප දෙවියන්වහන්සේව කොතරම් දුරට සොයනවාද? එපමණ දුරට අපි දෙවියන්වහන්සේගේ අණට කීකරුවෙනවාය කියා ඔප්පු කරමු. මන්ද යේසුස්වහන්සේ පවසනු ලැබුයේ, ***''නුමුත් පළමුකොට***

6 වෙනි පිටුවට...

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**සැප්: 19-** "කැඳවීම ප්‍රතිරාවය" පවුවත්පත් සේවයේ සියලුම කණ්ඩායම් සාමාජිකයන් ගැන ස්තුති කරන්න.

**සැප්: 20-** "කැඳවීමේ ප්‍රතිරාවය" පුවත්පත් සඳහා උපකාර කරන සියලුම දෙනා ගැන ස්තුති කරන්න.

**සැප්: 21-** ප්‍රාදේශිය කිතුණු සභාවල සේවය සහ එහි වර්ධනය ගැන ස්තුති කරන්න.

**සැප්: 22-** ගෘහ කිතුණු සභාවල සේවය හා එහි වර්ධනය ගැන ස්තුති කරන්න.

**සැප්: 23-** මිශනාරීවරුන්ගේ සේවය ගැන ස්තුති කරන්න.

**සැප්: 24-** කිතුණු ළමා සේවයේ වර්ධනය ගැන ස්තුති කරන්න.

**සැප්: 25-** නොගලැවුනු සෙනඟ සිටින ප්‍රදේශ වලට ශුභාරංචිය රැගෙන යන අය ගැන ස්තුති කරන්න.

**සැප්: 26-** කිතුනු සභා වැඩිහිටි මණ්ඩල හා වැඩිහිටි සේවය ගැන ස්තුති කරන්න.

**සැප්: 27-** කිතුනු සභා පුරුෂ හා කාන්තා සේවාවල වර්ධනය ගැන ස්තුති කරන්න.

**සැප්: 28-** බයිබල් විදුහල් වල ගුරු සේවයේ යෙදෙන සෑම අයෙක් ගැනම ස්තුති කරන්න.

**සැප්: 29-** කැපවීමක් ඇතිව දේව සේවය කරන සේවකයන් ගැන ස්තුති කරන්න.

**සැප්: 30-** යාච්ඤා මැදහත් කරුවන්ගේ සේවය ගැන ස්තුති කරන්න.

### 2019 ඔක්තෝබර් මාසය

**ඔක්: 01-** සැප්තැම්බර් මාසය පුරාවට අපට ආශිර්වාද කල දෙවිඳුන්ට ස්තුති කරන්න.

**ඔක්: 02-** කැඳවීමේ ප්‍රතිරාවය නිර්මාතෘ සෑම් සෙල්වරාජ්ගේ සේවය ගැන ස්තුති කරන්න.

**ඔක්: 03-** සියලුම කිතුනු සභා පාලකවරුන් ගැන ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ඔක්: 04-** බයිබල් විදුහල් සිසු සිසුවියන්ගේ දීප්තිමත් අනාගත සේවය ගැන යාච්ඤා කරන්න.

**ඔක්: 05-** කිතුනු සේවාවන් මුහුණ දෙන මූල්‍යමය අර්බුද ගැන යාච්ඤා කරන්න.

**ඔක්: 06-** කිතුනු දේව සේවක පවුල්වල සුභසිද්ධි උදෙසා යාච්ඤා කරන්න.

**ඔක්: 07-** ත්‍රස්තවාදී ක්‍රියාවල සම්බන්ධවී සිටින අයගේ ගැලවීම උදෙසා යාච්ඤා කරන්න.

**ඔක්: 08-** දේවධර්මානුකුල පාඨමාලා හදාරන අයගේ ඉදිරි සේවය ගැන යාච්ඤා කරන්න.

**ඔක්: 09-** සුදුසු රැකියාවක් ලැබීම සඳහා යාච්ඤා කරන අය සමග එකතුව යාච්ඤා කරන්න.

**ඔක්: 10-** සුදුසු විවාහයක් සිදු කර ගැනීම සඳහා යාච්ඤා කරන අය සමග එකතුව යාච්ඤා කරන්න.

**ඔක්: 11-** සියලුම කිතුනු ඇදහිලිවරුන් උදෙසා යාච්ඤා කරන්න.

**ඔක්: 12-** ජනාධිපති, අගමැති ඇතුළු සියලුම දේශපාලක නායකයන් ගැන යාච්ඤා කරන්න.

**ඔක්: 13-** කිතුනු දේව සභා නිකායන් අතර එකමුතුකම උදෙසා යාච්ඤා කරන්න.

**ඔක්: 14-** තරුණ තරුණියන්ගේ ආරක්ෂාව උදෙසා යාච්ඤා කරන්න.

**ඔක්: 15-** ධීවර කටයුතුවල යෙදෙන අයගේ සුභ සාධනය උදෙසා යාච්ඤා කරන්න.

**ඔක්: 16-** මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී සිටින අය උදෙසා යාච්ඤා කරන්න.

**ඔක්: 17-** ඒඩ්ස් රෝගීන් හා පිළිකා රෝගීන් උදෙසා යාච්ඤා කරන්න.

**ඔක්: 18-** අපට වැරදි කල අයට දෙමින් යාච්ඤා කරන්න.

**4 පිටුවෙන්**

***උන්වහන්සේගේ රාජ්‍යද, උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයාපල්ලා. මේ සියල්ලත් නුඹලාට දෙනු ලබන්නේය'' (මතෙව් 6 : 33)***

**ක්‍රිස්තුස්වහන්සේගේ ආඥාවේ නූතන ඉදිරි දර්ශනය**

යේසුස්වහන්සේ පවසනු ලැබුයේ 'ශුභාරංචිය ප්‍රකාශ කරන්න' යනුවෙනි. මෙය මුළු ලෝ තලයේම සිටින කිතුණුවන්ට දුන් අණකි. පාවුළුතුමා මෙසේ පවසයි. ***''මක්නිසාද මම ශුභාරංචිය දේශනා කරමි. නමුත් පාරට්ටුකරගැනීමට මට කිසිත් නැත, මක්නිසාද එසේ කිරීමට බැඳී සිටිමි. ශුභාරංචිය දේශනා නොකළහොත් මට දුක්වේ'' (1 කොරින්ති 9 : 16)***

වර්තමානයේ දී මේ ලෝකයට ක්‍රිස්තුස්වහන්සේ ගේ ශුභාරංචිය අත්‍යාවශ්‍ය වී තිබේ. මන්ද අප කොයි අතට හැරුණත් අප දකින්නේ මනුෂ්‍යයන් කලකිරීමට පත් වී, රැවටීමට හසු වී, මුලාවී, තුවාල වී, පාපයේ බැමි වලින් බැඳී, සමාදානයක් නොමැතිව, ජීවිතයෙ අර්ථයක් නොමැතිව හා කිසිම දර්ශනයක් නොමැතිව ජීවත්වෙන්නාවූ ආකාරයයි. අද ලෝකයට සුභාරංචිය අවශ්‍ය වේ.

**(3) ක්‍රිස්තියානි ජීවිතය තුළ ජීවත් වීමට ඇති වැදගත් කරුණු**

යම්කිසි පුද්ගලයෙකු සාර්ථක ව්‍යාපාර කටයුත්තක් කළයුතු නම්, ඔහු ඒ සඳහා සාර්ථකවීම තිබෙන සියලුම දේ ඉගෙනගනී. නමුත් බොහෝ ක්‍රිස්තියානි පුද්ගලයින් තමාගේ ජීවිතයට දෙවියන්වහන්සේ දමා තිබෙන්නාවූ නීති රීති ඉගෙන ගැනීමට කැමැත්තක් නොදක්වති. යේසුස්වහන්සේ මේ ගැන මෙසේ පැවසීය.***''අධර්මිෂ්ඨ ගබඩකාරයා නුවණින් ක්‍රියාකල නිසා ඔහුගේ ස්වාමියා ඔහුට ප්‍රශංසා කළේය. මක්නිසාද අලෝකයේ පුත්‍රයන්ට වඩා මේ ලෝකයේ පුත්‍රයෝ තමන්ගේම පරම්පරාව ගැන නුවණැත්තේය. (ලූක් 16:8)*** මෙහිදී උන්වහ්නසේ සඳහන් කරන්නේ දේව දරුවන්ට වඩා ලෝකයේ දරුවෝ ඉතා බුද්ධිමත් ලෙස ක්‍රියා කරන බවයි. කිතුණුවෙක් මේ ලෝකයේ සිටින අයට වඩා ඔවුන් කරන ක්‍රියා තුල ඉතා නුවනක්කාරව සිටිය යුතුය. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක. මනුශ්‍යයෙක් ගොඩනැගිල්ලක් සාදනවා නම් එය සාදා නිම කිරීමට සැලසුම් දමා සියලු මුදල් සපයාගෙන කල යුතුය.

එසේ නම් ක්‍රිස්තුස්වහන්සේ අපව ඉතා ඥානවන්ත ලෙස ඔවුන්ගේ කටයුතු කල යුතුය.

***''එවිට පේත්‍රුස් කථාකොට, අප වනාහි අප සන්තක දේ අත්හැර ඔබවහන්සේ අනුව ආවෙමුයයි කීවේය. උන්වහන්සේ සැබැවින්ම නුඹලාට කියමි. දෙවියන්වහන්සේගේ රාජ්‍යය නිසා ගෙය හෝ භාර්යාව හෝ සහෝදරයන් හෝ දෙමවුපියන් හෝ දරුවන් හෝ අත්හැරිය කවරෙක් නුමුත්, මේ කාලයේදී ඊට බොහෝ වැඩියෙන්ද පරලොවදී සදා කාල ජීවනයද නොලැබ නොසිටින්නේයයි කීසේක. (ලූක් 18:28-30)***

**නොකඩවා යාච්ඤා ජීවිතයක් ගත කරන්න.**

යම්කිසි කෙනෙකුට පරිනත කිතුණු ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය නම් දෙවියන්වහන්සේ දුන් සෑම පලමු දේ නම් ඔහු නොකඩවාම යාච්ඤා ජීවිතයක් ගත කල යුතුය. සැමදාම යාච්ඤා කරන පුද්ගලික ජීවිතයක් තිබේනම් ඔවුන් සැමදේම ලබාගන්නේය. දෙවියන්වහන්සේගේ හස්තය ක්‍රියා කරන්නේ අපගේ යාච්ඤාවයි. යේසුස්වහන්සේ දුන්නාවූ පොරොන්දුවක් මෙන්න.

***''ඉල්ලන්න, එවිට නුඹලාට දෙනු ලැබේ, සොයන්න, එවිට නුඹලාට සම්බවේ, තට්ටුකරන්න, එවිට නුඹලාට දොර අරිනු ලැබේ. මක්නිසාද ඉල්ලන්නාවූ සියල්ලන්ට ලැබේ. සොයන්නාට සම්බවේ, තට්ටුකරන්නාට දොර හරිනු ලැබේ'' (මතෙව් 7:7-8)***

මාර්ක් 11:22-24 හි යේසුස්වහන්සේ ඇදහිල්ලේ යාච්ඤාවේ බලය ගැන සඳහන් කර ඇත. ''යේසුස්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්,

*7 වෙනි පිටුවට....*

දෙවියන්වන්සේ කෙරෙහි ඇදහිල්ල ඇතුව සිටින්න. කවරෙක් නුමුත් මේ කන්දට කථාකොට: ඉදිරි මුහුදේ වැටෙන්නයි කියා, තමාගේ සිතින් සැක නොකොට තමා කියන දේ සිදුවේයයි අදහන්නේ නම්, ඒක ඔහුට සිදුවන්නේය. එබැවින් නුඹලාට කියමි, නුඹලා යාච්ඤා කොට ඉල්ලන මොන දෙයක් වුවත් ඒ සියල්ල නුඹලාට ලැබෙන්නේය. අදහන්න, ඒවා නුඹලාට ලැබෙන්නේය.

මාගේ ප්‍රධාන දැනමුතුකම නම්, දිනපතා යාච්ඤා කිරීම ඔබගේ පුරුද්දක් කොට තබාගන්න. ඔබගේ ජීවිතයේ සෑම වැදගත් කාරණාවක්ම යාච්ඤාවෙන් දෙවියන්වහන්සේගේ පාමුලට ගෙන යන්න. ඔබගේ දිනපතා ක්‍රියාව, ආර්ථිකය, පුද්ගලික ප්‍රශ්නය ඔබගේ පවුලේ ප්‍රශ්නය ඔබගේ රැකියාවේ බලාපොරොත්තුව යන සෑම දේම විශ්වාසනීයව දිනපතා යාච්ඤාවෙන් ස්වාමීන්වහන්සේ වෙතට ගෙන ගියහොත් ඔබට බලවත් ආශිර්වාදය දැකීමට හැකිය.

සෑම සියලුදෙනා උදෙසාම උන්වහන්සේට සැලසුමක් තිබේ. ඔබ මිෂනාරිවරයෙක් හෝ සභාවේ සේවකයෙක් හෝ ව්‍යාපාරිකයෙක් හෝ ඕනෑම දෙයක් කරන්නෙක් වූවත් දෙවියන්වහන්සේට ඔබ ගැන ඉතා උතුම් සැලසුමක් ඔබගේ ජීවිතය ගැන තිබෙන නිසා යාච්ඤා කරමින් ඒ සේවාවන් සඳහා ආශිර්වාදය ලබා ගත යුතුය. බොහෝ කිතුණුවන් දෙවියන්වහන්සේගේ හොඳම දේත් නැති කර ගනිති. බොහෝ විට මෙය තමා විවාහ වීමට පෙර සහකරුවෙකු හෝ සහකාරියකු සොයා ගැනීමේදී ඔවුන් යාච්ඤා නොකර සිටිනවා නම්, ඔහුට වැරදි සහකරුවෙකු හෝ සහකාරියෙකු ලැබී විවාහ ජීවිතයේ අනවශ්‍යය ප්‍රශ්න වලට මුහුණ දීමට සිදුවී ඔහුගේ මුළු ජීවිතයම විනාශයට පත් වෙනු ඇත. එමනිසා හැම දේ තුළින්ම යාච්ඤාවේ ජීවිතයක් ගත කරන්න. මේ දේ මුල් සභාවේ ද කරනු ලැබීය. ***(ක්‍රියා 3:1)*** එමෙන්ම තමාගේම අවශ්‍යතා වලට යාච්ඤා කිරීමට වඩා අන්අය ගැන විශේෂයෙන් යාච්ඤා කරන්න. මෙය මැදිහත්කමින් යාච්ඤා සේවයයි. මේ කැඳවීම සියලු දෙනාටම තිබේ. මැදිහත්කාර සේවයේ තිබෙන බලය ගැන දේව වචනය මෙසේ පවසයි. ***(එසකියෙල් 22 : 30-31)*** දේව වචනය බලාපොරොත්තු වන්නේ උන්වහන්සේගෙන් ඈත්ව ගිය සෙනඟ උන්වහන්සේ වෙතට එන්නය කියා යාච්ඤා කළ යුතුය. නමුත් මෙවැනි යාච්ඤාවන් කිසිවෙක් නොකරන නිසා උන්වහන්සේගේ උදහස පැමිණ තිබේ.

### දිනපතා දේව වචනය කියවන්න.

ඔබට බයිබලය තේරුම් ගැනීමට අවශ්‍යය නම් ඔබ දේව වචනය හැම විටම ඉගෙන ගත යුතුය. බයිබලයේ කතෘවරයාණෝ ස්වර්ගීය පියාණන් බව ඔබ දන්න නිසා එම පියාණන්වහන්සේ පවසන්නා වූ දේ ඔබ ඉගෙන ගත් විටදී ඔබට මහත් ධෛර්යයක් හා ශක්තියක් ලැබෙනු ඇත. බයිබලයේ ඇති සමහර පොත් කියවා තේරුම් ගැනීමට ඉතා අපහසුය.

*8 වෙනි පිටුවට...*


## ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministry** is supported by the free-will offerings and donations of the God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us. Whenever you change your postal or e-mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our websites also. You can read it by going into the site as well as downloading it and get blessed.

Your letters, prayer requests and your financial helps (by D.D., Cheque, M.O. etc.) to **ECHO OF HIS CALL** may be sent to the address below.

Please send your **Land Phone / Cell Phone Numbers and E.mail addresses** for updation.



**ECHO OF HIS CALL**

10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai - 600 005, India.

Phone : (+91- 44) 2852 8282, 2852 9293, 2854 7766 Cell : (+91) 98410 71852

E-mails : sam@echoofhiscall.org / biblecor@yahoo.co.in Websites : www.echoofhiscall.org / www.echoofhiscall.com

*7 වෙනි පිටුවෙන්....*

බයිබලයේ අලුත් ගිවිසුම හා පරණ ගිවිසුම කියා කොටස් 2 කට බෙදා ඇත.

කාලයෙන් කාලයට දෙවියන්වහන්සේ මනුෂ්‍යා සමඟ ක්‍රියා කළේ කෙසේද? කියාත් යේසුස්වහන්සේගේ පැමිණීමට පෙර සිදු වූ සියල්ලත් පරණ ගිවිසුමේ සඳහන් වන අතර යේසුස්වහන්සේගේ පැමිණීමට පසුව අලුත් ගිවිසුමෙහි ලියනු ලැබීය. සුභාරංචි පොත් වන මතෙව්, මාර්ක්, ලූක් සහ යොහාන් යන පොත්වල ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිත කතාව හා සේවය ගැන සඳහන් කර ඇත. හැම කිතුණුවෙක්ම මේ පොත් කියවීමට පටන්ගත යුතුය. ක්‍රියා පොතෙහි සඳහන් කරනු ලබන්නේ ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගයට ගිය පසු ගෝලයන් උන්වහන්සේගේ සේවය පටන් ගත් ආකාරය හා සභාවේ ආරම්භයයි. ශුද්ධ වූ පාවුළුතුමා විසින් අලුත් ගිවිසුමේ බොහෝ පොත් ලියා ඇත. ඒ සියල්ල මුල් කාලයේ සිට කිතුණුවන් ජීවත් විය යුතු ආකාරය පිළිබඳව ලියා ඇත.

ඔබගේ කිතුණු ජීවිතයට මඟපෙන්වීම අවශ්‍යය නම් අලුත් ගිවිසුම පොත් පිළිවෙලට පොතෙන් පොත කියවිය යුතුය. අලුත් ගිවිසුමේ පොත් කියවූ පසු ඔබට පරණ ගිවිසුමේ පොත් කියවිය හැකිය. එනම්, පරණ ගිවිසුමේ උන්වහන්සේ සමඟ ගනුදෙණු කළා වූ ස්ත්‍රීන් හා පුරුෂයන් ගැනත්, අකීකරු වූ අය ගැනත් දෙවියන්වහන්සේ ක්‍රියා කරනු ලැබුවේ කෙසේද? කියාත් පැහැදිලිව සඳහන් කරන නමුත්, අලුත් ගිවිසුම විශේෂයෙන් වර්තමාන සභාවට ලියා ඇත. සෑම කිතුණුවෙක්ම දිනකට බයිබල් පරිච්ඡේද 3 ක් වත් කියවිය යුතුය. එමෙන්ම ඔබගේ සභා පාලකතුමාගේ අවසරය මත බයිබල් පාඩම් මාලාවක් පවත්වන්නාවූ ස්ථානයකට ගොස් ඉගෙන ගන්න, එමෙන්ම දේව වචනය ඉගෙන ගන්නා පිණිස ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟ පෙන්වීමද ලබා ගන්න.

## (3) දෙවියන්වහන්සේට දීමේ දී විශ්වාසවන්ත වෙන්න.

යාකොබ්ගේ ජීවිතය ගැන අපට බයිබලය තුළින් ඉගෙන ගැනීමට පුළුවන. ඔහුගේ ජීවිතයේ ඉතාම දුක්බර දේවල් සිදුවීය. ඔහුගේ ජීවිතයට දෙවියන්වහන්සේව මුණ ගැසෙන තුරු මේ ආකාර වූ ජීවිතයක් ගත කිරීමට සිදුවිය. ඔහු ඉතාම භයානක වූ ප්‍රශ්න වලට මුහුණ දුන්නේය. ඔහුගේ රැවටිලිකාර වූ ජීවිතය නිසා, ඔහු ඔහුගේම නිවසින් පලා ගියේය. නමුත් ඒ රාත්‍රියේ දී දෙවියන්වහන්සේ ඔහුට දර්ශණයක් දුන්නේය. ඒ දර්ශණය ඔහුගේ ජීවිතය වෙනස් කළේය. එම ස්ථානයේ දී ම ඔහු තමාට ලැබෙන්නා වූ සෑම දේ තුළින්ම දසයෙන් කොටස දීමට දෙවියන්වහන්සේට පොරොන්දු විය. ***(උත්පත්ති 28 : 20-22)*** අද බොහෝ දෙනා දෙවියන්වහන්සේට දිය යුතු දසයෙන් කොටස දෙන්නේ නැත. මෙවැනි අයට දෙවියන්වහන්සේ පවසන්නේ බොරුකාරයන් ලෙසය. ඔහු සොරකම්


**ඔබගේ කරුණාවන්ත අවධානය සඳහා**

**කැඳවීමේ ප්‍රතිරාවය** තුළින් සිදුවන විවිධාකාර සේවයන්, දෙවියන්වහන්සේගේ සේවයන් යයි ඔබ විශ්වාස කරනවාද?.......................

කුමන ආකාරයකින් හෝ, **කැඳවීමේ ප්‍රතිරාවය** හි සේවයන්ට දායක වීමට ඔබ කැමති වන්නේද? ..........................................................................

ඔබගේ මහත් සැලකිලිවන්ත යාච්ඤා තුළින් මෙම සේවයන් ඉදිරියේ **යාච්ඤා හවුල්කරුවකු** වීමට ඔබත් කැමතිද?............................

,**කැඳවීමේ ප්‍රතිරාවය,** සේවයන් හමුවේ, කුඩා මාසික දීමනාවකින් (මාස 12) ඇදහිල්ලේ පංගුකාරයකු වීමට, ඔබ අදහස් කරන්නේද?

..........................................................................................................................................................................

කරුණාකර අපට ලියන්න.



**ECHO OF HIS CALL,**

10, Mohammed Abdullah II Street, Chepauk, Chennai - 600 005, India.

Ph.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766 Cell: (+91) 98410 71852.

**E-mail: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in Websites: www.echoofhiscall.org / www.echoofhiscall.com**



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## "...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

### දෙවියන්වහන්සේම දෙනසේක. (උත්පත්ති 22:14)
### ස්වාමින්වහන්සේ සපයන ලදී. (හිතෝපදේශ 22:14)

මුල් කාලයේදී මගේ සේවය වෙන්නයි නුවර ආරම්භ කල විටදී බොහෝ ප්‍රශ්න හා කරදර වලට මා මුහුණ දුන්නෙමි. එම පලාතේ කිතුණුවන් ලෙස සිටියේ මා සහ මගේ පවුලේ අය පමණි. ඒ පලාතේ සිටි අය විසින් අපට බොහෝ කරදර සිදු කරන ලදී. අපගේ වාහනය පවා නැවතුම් පලෙහි නැවැත්වීමට ඉඩ දුන්නේ නැත.

එම ස්ථානයේ අප ජීවත් වූ නිවස ඉතාම පරණ හැම ස්ථානයක්ම පළුදු වී තිබූ නිවසකි. එහි සෑම තැනම ඇතුලත හා පිටත අබලන්ව තිබූ අතර සිවිලිමද කැඩී තිබූ නිසා වර්ෂාවට තෙමෙන්නට ද විය.

මේ අතර බොහෝ අපහසුතාවයන්ට අපට මුහුන දීමට සිදු විය. තවද අපගේ නිවස අසල තිබූ නිවසෙහි සිටි මනුෂ්‍යයා අපගේ නිවස නිසා ඔහුගේ නිවසට වතුර පැමිණ මහත් බාධාවක් කරන බව පැවසිය. එම නිසා ඔහුගේ නිවසේ තිබෙන සියලු පළුදු වීම් අලුත් වැඩියා කර දෙන්නය කියා ද පවසමින් ගමේ සෙනඟවද හවුල් කර ගනිමින් අපට බොහෝ කරදර කිරීමට පටන් ගත්තේය. නමුත් එම අලුත් වැඩියා කටයුතු කිරීමට තරම් ප්‍රමාණවත් මුදලක් මා සතුව තිබුනේ නැත. සමහර අය මගේ පැත්තට කතා කල මුත් ඔවුන්ගේ කරදර නතර කලේ නැත. තවද අපගේ දේව මෙහෙයන් වලට පැමින අපට කරදර කරන බවද ඔවුන් පවසනු ලැබීය.

මා මගේ යාච්ඤා කාමරය වෙතට ගොස් දෙවියන්වහන්සේ ඉදිරයෙහි යාච්ඤා කරමින් දේව දූතයන් පැමිණ අපට උපකාර කරන්නය කියා යාච්ඤා කලෙමි. මා මෙලෙස යාච්ඤා කරන විටදී මගේ පාලකතුමා වන පී. සුන්දරම් ඉගැන්වූ ඉගැන්වීමක් වන "අනෙක් අය අපට මොනවා කලත් අප එසේ නොකල යුතුය" යන ඉගැන්වීම මගේ මතකයට ආවේය. එනිසා මා අසල්වාසීන්ගේ ඉල්ලීම ඉෂ්ට කලෙමි. මෙසේ දෙවියන්වහන්සේ මට පවසනු ලැබුයේ "මේ කි(යාව ම උදෙසා කරපන්න දවසකදී ඒ මුලු ගොඩනැගිල්ලම මා ඔබට දෙමියි කියාය. මෙය මට ඉතා විශාල වූ මුදලක් වූවත් දෙවියන්වහන්සේ මට උපකාර කලා මා උන්වහන්සේට කීකරු වූවා. මා එම ක්‍රියාව කලා එමෙන්ම ස්වාමින්වහන්සේ මට සපයන බවට මා විශ්වාස කලා.

මෙලෙස මාස 6ක් ගත වීමට ප්‍රථම දෙවියන්වහන්සේ මා හට උපකාර කරමින් මුදල් දී එම මුලු ගොඩනැගිල්ලම තනා තිබෙන්නේ මෙම ස්ථානයෙහිය. අපට සිටින්නේ හාස්කම් කරන්නාවූ දෙවියන්වහන්සේ කෙනෙකි.

RNI NO. TN/SIH/2006/17846

*8 වෙනි පිටුවෙන්...*

කරනු ලැබුවේ දෙවියන්වහන්සේගේ දේවල්ය. ***(මලාකි 3 : 8 - 10)***

දෙවියන්වහන්සේට විශ්වාසනීයව දසයෙන් කොටස දෙන්නා වූ අයට උන්වහන්සේ විශේෂ වූ ආශිර්වාදයන් වගුරුවන බවට පොරොන්දු වී තිබේ. අපට ලැබෙන්නා වූ සියලුම දීමනා ලැබෙන්නේ උන්වහන්සේගෙනි. මන්ද උන්වහන්සේ අපට හොඳ සුවයක් හා ශක්තියක් දී තිබූ නිසා අපට මහන්සි වී වැඩ කිරීමට හැකියාව ලැබුණි. එනිසා ස්වාමීන්වහන්සේ අපට පවසන්නේ අපට ලැබෙන්නාවූ සියලුම දෙයින් ස්වාමීන්වහන්සේට දසයෙන් කොටස දෙන්නය කියා ය.

පළමුකොට දෙවියන්වහන්සේගේ සේවය සඳහා උපකාර කිරීම අපගේ ජීවිතයේ කොටසක් විය යුතුය. ඔබට ලැබෙන හැම දේ තුළින්ම දෙවියන්වහන්සේගේ කොටස හරියාකාරව දීමට ඉගෙන ගන්න. එමෙන්ම උන්වහන්සේගේ ධර්මදූත සේවය ගැන සලකා උන්වහන්සේව නොදන්නා වූ අයට සුභාරංචිය ප්‍රකාශය පිණිස අපගේ සෑම දෙයම යොදවා පාවිච්චි කරමු. ක්‍රිස්තුස්වහන්සේ පවසනු ලැබුවේ නුඹලා ප්‍රකාශ කරන ලෙසයි. මේ කාරණය සාර්ථක වීමට නම්, ඔබගේ ජීවිතය, ඔබගේ මුදල් ස්වාමීන්වහන්සේට දෙන්න. ස්වාමින්වහන්සේ නුඹට ආශිවාද කරන සේක.

## කරුණාකර අප ප්‍රධාන සභාවේ සේවාවන් උදෙසා යාච්ඤා කරන්න.

1. යාච්ඤා සේවය - පැය 24 පුරා
2. බයිබල් තැපැල් පාඩම් මාලාව - ඉංග්‍රීසි, දෙමල හා හින්දි
3. කැඳවීමේ ප්‍රතිරාවය - මාසික සඟරාවන් දෙමල, ඉංග්‍රීසි, මලයාලම්, තෙලගු, හින්දි, මරාති, කන්නඩා, බෙංගාලි, ගුජරාති, ඔරියා, නේපාලි, අසාම්, පංජාබි, උර්දු, සිංහල සහ අප්‍රිකානාස්
4. නෙහෙමියා බයිබල් විදුහල
5. තැපැල් මාර්ගික බයිබල් පාඨමාලාව - දෙමල සහ ඉංග්‍රීසි
6. පුහුණුවීමේ වැඩසටහන්
7. චිත්‍රපටි සේවය සහ ශුභ ආරංචි රැස්වීම්
8. ශුභ ආරංචි පත්‍රිකා මුද්‍රණය කිරීම - ප්‍රකාශනය කිරීම.
9. මුද්‍රිත සේවය පවත්වාගෙන යාම.
10. ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසල
11. සබත් පාසල - ඉරිදා පෙ.ව 8.30
12. දෙමළ භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා පෙ.ව 5.00, 7.00 හා 10.00
13. තෙලෙගු භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා ප.ව 4.00
14. හින්දි භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා ප.ව 5.00
15. මලයාලම් භාෂාවෙන් දේව මෙහෙය- ඉරිදා ප.ව 5.00
16. ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා ප.ව 6.00
17. පත්‍රිකා බෙදා හැරීම. - ඉරිදා ප.ව 2.30
18. පාලක වරුන්ට උපදෙස් දීම. - ඉරිදා ප.ව 4.00
19. කාන්තා යාච්ඤාව - බදාදා ප.ව 5.30
20. සති මැද නමස්කාර දේව මෙහෙය
21. පුරුෂයින්ගේ යාච්ඤාව - සිකුරාදා ප.ව 8.00
22. සෙනසුරාදා දේව මෙහෙය - ප.ව 5.00
23. සේවකයින්ගේ රැස්වීම - සෙනසුරාදා ප.ව 6.00
24. ගෘහ රැස්වීම් - අඟහරුවාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා ප.ව 6.30
25. විශේෂ රාත්‍රි භෝජනය - පළමු ඉරිදා උදෑසන 5.30
26. දෙමාපියන්ගේ යාච්ඤාව - පළමු ඉරිදා ප.ව 4.00
27 උපවාස යාච්ඤාව - පළමු සෙනසුරාදා පෙ.ව 9.30
28. සර්ව රාත්‍රි යාච්ඤාව - දෙවෙනි සිකුරාදා ප.ව 9.30
29. ශුද්ධවූ රාත්‍රි භෝජනය - දෙවන ඉරුදින දේව මෙහෙය
30. දිනපතා උදෑසන දේව මෙහෙය - පෙ. ව 5.00
31. කාර්යාල මණ්ඩලයේ මෙනෙහි කිරීම - දිනපතා පෙ.ව 9.00
32. කාර්යාල සේවය - දිනපතා පෙ.ව 9.00 සිට ප.ව 9.00

**Regd. with the Registrar of Newspapers for India**
**under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
**on 2nd SEPTEMBER 2020**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from Old No.18, New No. 10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by him at **Echo of His Call Printers** Old No. 18, New No. 10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**